ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධිය - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය **II - LWU 2314**

කාලය - පැය 3 යි.

---

දිනය - 2007.03.14 වේලාව - පෙ.ව.10.00 - ප.ව.01.00 දක්වා

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් කොටසකින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

පළමුවන කොටස - මූලික අයිතිවාසිකම්

මෙම කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

01. වෘත්තීය සමිති නායකයකු වන සමන්ත, 2007 පෙබරවාරි මස 14 වන දා උදෑසන 8.00 ට ඔහුගේ පක්ෂ මූලස්ථානයේ සිටින විට පොලිසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. එම අවස්ථාවේදී සමන්ත තමාව අත්අඩංගුවට ගැනීමට හේතුව පොලිසියෙන් අසන ලදී. පොලිසිය කිසිම හේතුවක් දැක්වීම ප්‍රතික්ෂේප කළේය. පොලිස් නිලධාරීන් සමන්තට බැණ වැදුණ අතර බලෙන්ම ඔහුව ජීප් රථයට දමාගන්නා ලදී. සමන්තව පොලිස් ස්ථානයට ගෙනෙන අතරතුර පොලිසිය ඔහුගේ කම්මුලට හා ඔහුට පහර දුන්නේ ය. පොලිස් ස්ථානයට ගෙන ඒමෙන් අනතුරුව ඔහුව පොලිස් කූඩුවට දමන ලදී. පොලිස් අත් අඩංගුවේ සිටින අතරතුර පොලිස් නිලධාරීන් විසින් ඔහුගෙන් දිගින් දිගටම ප්‍රශ්න කරන ලදී. ඔහුව ප්‍රශ්න කිරීම්වලට ලක්කරන අතරතුර පොලිසිය විසින් විවිධාකාරයේ පහත් ක්‍රමවේදයන්ට ඔහුව ලක් කළේය. ඉතාමත් දීප්තිමත් විදුලි බුබුළු දල්වන ලද කාමරයක ඔහුව තබන ලදී. එම අවස්ථාවේදී ඔහු පොලිසියෙන් වතුර ටිකක් ඉල්ලූ අතර එය පොලිසිය ප්‍රතික්ෂේප කළේය. පසුදින උදෑසන 10 ට පමණ පොලිසිය විසින් සමන්තව නිදහස් කළේය.

ඉහත සඳහන් සිද්ධිමය කාරණාවන් යටතේ, පොලිසියට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට සමන්තට අවශ්‍යව ඇත.

ඔහුට උපදෙස් දෙන්න.

02. *Purshottam* vs *Desai* [A.I.R.1956 SC 20], නඩුවේදී දාස් අග විනිසුරු නිරීක්ෂණය කළ පරිදි , "... ව්‍යවස්ථාවේ අරමුණ සඳහා සාධාරණ වර්ගීකරණයක් තහනම් කරන්නේ නැත., ..... වර්ගීකරණය විවිධ පදනම් මත සොයාගත හැකිය. එනම් භූගෝලීය හෝ අරමුණට අනුව හෝ රැකියාව හෝ එවැනි වර්ගීකරණයේ පදනම් අතර ඒකාබද්ධතාවයක් තිබිය යුතු අතර පනතේ අරමුණ සැලකිල්ලට ගත යුතුවේ."

විනිශ්චිත නඩුතීරණ කෙරෙහි අවධානය යොමුකරමින් ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

03. ඉරාකයේ හිටපු ජනාධිපතිවරයාගේ එල්ලා මැරීම විකාශනය කිරීමට එරෙහිව ශ්‍රී පුර රාජ්‍යයේ මුස්ලිම් ජනතාව, ජාතික රූපවාහිනී මූලස්ථානය ඉදිරිපිට විරෝධතාවයක් සංවිධානය කළේය. ඔවුන්, බැනර්, පෝස්ටර් හා අනුරූ **(dummies)** ඔවුන්ගේ විරෝධතාවයට යොදා ගන්නා ලදී. විරෝධතාවයේ සංවිධායකයා වන මොහොමඩ් මහතා කථාවක් කළ අතර මොහොමඩ් මහතාගේ කථාවේ කරුණුවලින් කුපිත වූ විරෝධතාකරුවන් ජාතික රූපවාහිනී මූලස්ථානයට පහරදුන් අතර අසල තිබූ ගොඩනැගිලිවලට අලාභහානි කළේය. ජාතික රූපවාහිනියේ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම මත එතනට පොලිසිය පැමිණි අතර විරෝධතාකරුවන්ට පහරදෙන ලදී. පහරදෙන අතරතුරේදී විරෝධතාකරුවන් විසින් භාවිතා කරන ලද බැනර්, පෝස්ටර් හා අනෙකුත් ද්‍රව්‍යයන් පොලිසිය විසින් විනාශ කර දමන ලදී. මොහොමඩ් මහතා පොලිසියට එරෙහිව ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කරයි.

ඔහුට උපදෙස් දෙන්න.

ශ්‍රී පුර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට සමාන බව උපකල්පනය කරන්න.

04. "රජය වගකීමට ලක්කරනු ලබන මූලික අයිතිවාසිකම් කඩකරනු ලබන විධායක හෝ පරිපාලන ක්‍රියාව යන්නෙන් " අදහස් වන්නේ කුමක් ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධායක හෝ පරිපාලන ක්‍රියාව යන්නට අර්ථ දැක්වීමක් නොමැති අතර විධායක හා පරිපාලන ක්‍රියාව යන සංකල්පය නියමාකාරයෙන් ගොඩනැගීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉඩ සලසා ඇත."

**Justice S. Sharvananda, - Fundermental Rights in Sri Lanka.**
**(a commentary) at page 18.**

ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

## දෙවන කොටස - බලය බෙදීම

**මෙම කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

05. බලය බෙදීම පිළිබඳ කල්පනා කිරීමේදී එකවරම සිහියට නැගෙන්නේ 'ෆෙඩරල්වාදය' වේ. නමුත් ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ බලය බෙදිය හැකි තවත් ක්‍රම ඇත්තේ ය. එමනිසා ඒකීය හා සන්ධීය ක්‍රමයන් අතර වෙනස බලය බෙදීම මත පදනම් වේය යන්න හැමවිටම සැක සහිත කරුණක් වේ.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

06. ආණ්ඩුවක බලය බෙදූ විට එය ගැටීමට ලක්වේ. ගැටුම් මතුවන විට එම ගැටුම් පිළිබඳ මත ප්‍රකාශ කළ හැකි බලය සහිත ස්වාධීන ආයතනයක් තිබීම අවශ්‍ය වේ. එමනිසා බලය බෙදීමේ ක්‍රමයක් යටතේ අධිකරණ විමර්ශන ක්‍රමයක් පැවතීම අත්‍යාවශ්‍යය වේ.

ඉහත ප්‍රකාශය කෙරෙහි අවධානය දක්වමින් අධිකරණ විමර්ශනයේ වැදගත්කම පිළිබඳ ඔබේ මතය ලියා දක්වන්න.

07. පහත මතයන් කෙරෙහි අවධානය දක්වමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනය විශ්ලේෂණාත්මකව විග්‍රහ කරන්න.

- 13 වැනි සංශෝධනය මගින් 82 ව්‍යවස්ථාව මතබේදාත්මක වී ඇත ;
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනම් ව්‍යුහය 13 වන සංශෝධනය මගින් වෙනස් කර ඇත ; සහ
- 13 වන සංශෝධනය මගින් ව්‍යවස්ථාදායක බලය විභේදනය කර ඇත.

08. පහත සඳහන් ඕනෑම <u>දෙකක්</u> පිළිබඳ සටහන් ලියන්න.

(අ) පළාත් බද මහාධිකරණ.

(ආ) පළාත් රාජ්‍ය සේවය

(ඇ) විමධ්‍යගතකරණය එ. බලය බෙදා හැරීම

- හිමිකම් ඇවිරිණි. -